# වෙසක් කූඩුව



ජිහන්සා බෝවින්දි බණ්ඩාර

# වෙසක් කූඩුව

ජිහන්සා බෝවින්දි බණ්ඩාර
(කතෘ)

ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල
4 වසර

2025-02-08

ISBN: 978624208853-2

# පිදුම

මාගේ පලමු ලේඛනයට මා ධෛර්යමත් කළ ආදරණීය අම්මාටත්, තාත්තාටත්, ලොකු අම්මාටත්, නංගීටත්, නන් අයුරින් මා හට උපකාර කළ සියළු ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත්, මාගේ යහළු යෙහෙළියන්ටත් ආදරයෙන් පිලිගන්වමි.



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පෙරවදන

මම ඉමහත් ප්‍රීතියෙන් ලියන මගේ මෙම පෙරවදන ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසලේ තරුණ ලේඛකයින්ගේ නිර්මාණශීලීත්වය, වෙහෙස මහන්සි වී වැඩ කිරීම සහ කැපවීම ඉස්මතු කරයි. අපගේම තරුණ කතුවරුන්ගේ ලේඛන සහිත පොතක් ප්‍රකාශයට පත් කිරීමේ අපගේ උත්සාහය මෙය වන අතර, ග්‍රීන්හිල් හි සියලු දෙනාට ලබා දී ඇති කාර්යයේ ජයග්‍රහණ පිළිබඳව මා කෙතරම් ආඩම්බර වනවාද යන්න ප්‍රකාශ කිරීමට මට අවසර දෙන අතර ව්‍යාපෘතියට සහාය වූ ගුරුවරුන්ට, දෙමාපියන්ට සහ උපදේශකයින්ට මගේ කෘතඥතාව පළ කරයි. හෙට දවසේ සහ ජාතියේ මෙම අංකුර නායකයින්ගේ අනාගතය හැඩගැස්වීමේදී කතන්දර කීමේ, ස්වයං ප්‍රකාශනයේ සහ වචනවල බලයේ වැදගත්කම ද අවධාරණය කරමි. අවසාන වශයෙන්, සිසුන්ගේ කටහඬ අගය කිරීමට සහ සැමරීමට පාඨකයින් දිරිමත් කරන අතරම ඔවුන්ගේ අදහස් දිගටම ලිවීමට සහ බෙදා ගැනීමට ඔවුන්ව පොළඹවයි.

අපගේ සිහිනය සැබෑ කර ගැනීම සඳහා ලබාදුන් මගපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් අපගේ පුස්තකාලයාධිපති හංසිකා රණවීර මහත්මියට සහ ප්‍රවීන ලේඛක සෙනෙවිරත්න මහාලේකම් මහතාට විශේෂ ස්තුතිය පුදකර සිටිමු.

"යුතුකම පළමු සතුට ඊළඟට"

ආචාර්ය ලලිත් නවරත්න,
විදුහල්පති,
ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල.

# වෙසක් කූඩුව

ලහිරුයි, විහඟයි හොඳම යාළුවෝ. ඒ දෙන්නම ගියේ එකම ඉස්කෝලෙට. එක දවසක් ඒ දෙන්නාගේ ඉස්කෝලේ වෙසක් කූඩු තරඟයක් තියනවා කියලා ගුරුතුමිය කිව්වා. ලහිරුට ලස්සනට වෙසක් කූඩු හදන්න පුළුවන්. ලහිරු ගෙදර ගිය ගමන්ම වෙසක් කූඩුව හදන්න පටන් ගත්තා.

කුඩු තරඟයක් තියනවා".



"තාත්තේ, තාත්තේ, අපේ ඉස්කොලේ වෙසක් කුඩු තරඟයක් තියනවා". ලහිරු තාත්තාට කිව්වා. මමත් ඒකට යන්නද? "පුතේ, වෙසක්

කූඩුවක් හදන්න නම් කොල එපැයිනේ" තාත්තා කිව්වා. "ඒ වගේම කොළ ගන්න කොහෙන්ද අපට සල්ලි?" "හැබැයි තාත්තේ මට දිනන්න පුළුවන්නේ, මම කොහොමහරි යන්න ඕනේ" ලහිරු තාත්තාට කිව්වා.

හරි, හරි, අපි කොහොමහරි යමුකෝ,



එදා උදේ ලහිරු ඉස්කෝලේ ගියේ කණගාටුවෙන්. විහඟ ලහිරුට කතා කරලා මෙහෙම කිව්වා. "යාළුවේ මොකද දුකින්

වගේ?. “මට වෙසක් කූඩු තරඟයට එන්න බැරිවෙයි.”




ඇයි ඒ? විහඟ ඇහුවා. “මගේ තාත්තාට සව් කොළ අරන් දෙන්න සල්ලි නැති නිසා මගේ වෙසක් කූඩුව හදන්න බැරිවෙයි.” “කමක් නෑ...

මගේ අම්මා මට කෑම ගන්න දුන්න සල්ලි වලින් මම ඔයාට සචි කොළ අරන් දෙන්නම්” විහඟ කිව්වා. “අනේ ගොඩක් ස්තූතියි ! යාළුවේ”. ලහිරු ගෙදර ගිහින් තාත්තාට හොරෙන්ම වෙසක් කූඩුව හැදුවා.



“මම හෙට ඉස්කෝලේ ගිහින් මේක ගුරුතුමියට භාර දෙන්න ඕනේ..” ලහිරු සිතුවා. ලහිරු උදෙන්ම ඇහැරිලා ඉස්කෝලේ ගිහින් වෙසක් කූඩුව ගුරුතුමියට භාර දුන්නා.



“අනේ හරි පුදුමයි ! ලහිරු මේක ලස්සන වෙසක් කූඩුවක්, මම මේක වෙසක් කූඩු තරගයට දාන්නම්” ගුරුතුමිය කිව්වා. පසුවදා ලහිරු ඉස්කෝලේ ගියේ හරි සතුටින්.



“ලහිරු, ලහිරු ඔයා වෙසක් කූඩු තරඟයෙන් දිනුම් කියලා ගුරුතුමිය කිවුවා”. ”අනේ එහෙමද? මට හරිම සතුටුයි, ඒක කරන්න පුළුවන් වුණේ ඔයා නිසානේ යාළුවේ..”

“ඕක මොකක්ද? අපි දෙන්නා හොඳ යාළුවෝනේ. අපි අපේ යාළුවන්ට උදව් කරන්න ඕනේ.” ඉස්කෝලේ ඇරුණ ගමන්ම ලහිරුත් විහඟත් ඉක්මණින් ගෙදර ගියේ මේ බව අම්මටයි තාත්තටයි කියන්න.

“ලහිරු වෙසක් කූඩු තරඟයෙන් දිනුම්” විහඟ කිවුවා.

මේ දෙන්නා හරියට සතුටු වුණා.

ලහිරු තෑගි වලින් කොටසක් විහඟටත් දුන්නා.



නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්